**ශීර්ෂය 268 - කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 268 - කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සදහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලිබදව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1. 6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව, පොදු තැන්පතු ලැබීම් රු.135,011,471ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පොදු තැන්පතු ලැබීම් රු.136,493,748ක් ලෙස රු.1,482,277 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රු.1,482,277ක් උතුරු පළාත් ලැබීම් වේ. වර්ෂ අවසාන හිඟහිටි කිසිවක් නොපැවැතුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල මේවා නොදක්වන බව. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කළයුතු ය. |
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් විකිණීමෙන් රු.1,675,760ක් මුදලින් ලැබී තිබූ නමුත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල වත්කම් විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහ රු.1,907,731ක් ලෙස රු.231,971කින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් නැවත ලැබී තිබුණු ආදායම් සංකේතවල එකතුව සසඳා අතිරික්තය සනාථ කර ඇත. මෙය නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් ඉඩම් 20ක වටිනාකම රු.334,395,000ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ නමුත් ඉන් රු.202,870,000ක් වටිනා ඉඩම් 13ක හිමිකාරිත්වය සනාථ කිරීමේ නීතිමය ලිපි ලේඛන නොපැවැතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් පැවැරීමේ කාර්යයන් අවසන් නොවී තවදුරටත් කටයුතු කෙරීගෙන යන ඉඩම් සම්බන්ධයෙන් නිලධාරී කමිටුවක් ස්ථාපිත කර, රැස්කරනු ලබන නිවැරදි තොරතුරු කඩිනමින් ලබාදී අවසන් කරන බව. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට නඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් සංවර්ධන ආඥා පනතේ 464 පරිච්ඡේදයේ 19(2) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ලබාදුන් ඉඩම් හිමිකම් ඔප්පු 132ක් අදාල ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව පුද්ගලයින්ට ලබා දීමට කටයුතු නොකර කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තබා තිබුණි. | ඉඩම් හිමිකම් ඔප්පු අදාල පුද්ගලයින්ට ලබාදීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කර අදාල පුද්ගලයින් වෙත හිමිකම් ඔප්පු කඩිනමින් ලබා දිය යුතුය. |
| (ආ) | 1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5(iii) සහ 6(ඇ) ඡේද | කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බදු දී තිබූ ඉඩම් වෙනුවෙන් 2005 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතු වාර්ෂික හිඟබදු සහ දඩ ගාස්තු එකතුව රු.3,129,750ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | එම මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර හිඟ බදු අයකර ගත යුතුය. |

### 2.2 අත්තිකාරම් ගෙවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, සේවයෙන් අස්වූ එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟහිටි ණය ශේෂය රු.114,230ක් පසුගිය වර්ෂ 13ක සිට අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පියවරෙන් පියවර අයකර ගනිමින් පවතින බව. | හිඟණය ශේෂ අයකර ගැනීමට පියවර ගතයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ අමාත්‍යාංශ හා වැඩසටහනෙහි මූල්‍ය ප්‍රතිපාදනයෙන් හකුරු නිෂ්පාදනය සහ තෙලිජ්ජ ඇසුරුම් කිරීම්, රා ඇසුරුම් කිරීම්, පළතුරු සහ එළවළු සැකසීම, පපඩම් නිෂ්පාදනය, පොල් තෙල් නිෂ්පාදනය සහ ඇසුරුම් කිරීම, කොම්පෝස්ට් නිෂ්පාදනය, මුරුංගා කොළ කුඩු නිෂ්පාදනය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන 62.64ක් වැයකර යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමත්, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හා නිෂ්පාදන මධ්‍යස්ථාන ඇති කිරීමත් සිදුකර සමුපකාර සමිති 04කටත් ග්‍රාමීය සංවර්ධන සමිති 02කටත් 2018 සහ 2019 වර්ෂයන්හිදී භාරදී තිබූ නමුත් ඒවා වර්ෂ 05කට අධික කාලයක් භාවිතා නොකර අභාවිතව පැවැතුණි. | දෛනිකව අමුද්‍රව්‍ය ලැබීම් ප්‍රමාණවත් නොවීම, නිෂ්පාදන වියදම් අධික වීම, වෙළෙඳ පොල අවස්ථා නොමැති වීම, තෙකලා විදුලිය නොමැති වීම, නිෂ්පාදන පිරියත හා යන්ත්‍රෝපකරණ ස්ථාපිත කළ ගොඩනැගිල්ලෙහි ඉඩ පහසුකම්වල ප්‍රමාණවත් නොවීම වැනි හේතු නිසා මෙහෙයුම් ක්‍රියාත්මක නොවිය. | අදාල ව්‍යාපෘති සක්‍රීය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පච්චිලෙයි පල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පදිංචිය සඳහා ගෙයක් නොමැති ජනතාව හඳුනාගෙන රු.31,590,000ක් වැයකර ඉදිකළ නිවාස 55කින් පසුගිය වර්ෂ 01 ක සිට 04ක් දක්වා කාලයක් ජනතාව පදිංචි නොවී එම නිවාස වටා කැලෑ වැවී නිෂ්කාර්යව පැවැතීම නිරීක්ෂණය විය. | රජය විසින් ලබාදුන් ස්ථිර නිවාසවලින් නිවාස 55ක වෛද්‍ය ප්‍රතිකාර සඳහා යෑම්, සහකරු නොමැතිව තනිව ජීවත් වීම, වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා විදේශගතවූවන් ඇතුළත්ව තිබුණි. ඔවුන් නැවතත් පැමිණ පදිංචි වන බව. | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට යොමු කර නැවත විමර්ශනය කිරීමකින් පසු ප්‍රතිලාභ අවශ්‍යම පුද්ගලයන්ට නිවාස ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික්කයට අයත් එකතුව වටිනාකම රු.4,600,000ක ශාලා සහ ගොඩනැගිලි 04ක් වර්ෂ 01 ක සිට වර්ෂ 10ක් දක්වා කාලයක් අභාවිතව පැවැති බව නිරීක්ෂණය විය. | ශාලාවේ මහල කොටස හානිවී තිබීම, ධීවරයින් ගේ විශ්‍රාම නිකේතනයෙහි විවෘත කිරීමේ උත්සවය නොපැවැත්වීම, ශාලාවට යන මාර්ගය අබලන්ව පැවැතීම, තරුණයින් ක්‍රීඩාවෙහි කැමැත්තක් නොදැක්වීම වැනි හේතූන් නිසා අභාවිතව පැවැතුණ බව. | අරමුණුගත කාර්යය සඳහා වත්කම් උපයෝජනයට විධිමත් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්දාවලෙයි සමෘද්ධි බැංකුවේ මුදල් ලැබීම් කුවිතාන්සි මුද්‍රිත පොත් ශේෂය හා භෞතික පොත් ශේෂය සැසඳීමේදී පොත් 200ක හිඟයක් පැවතුණි. මේ පිළිබඳව සමෘද්ධි බැංකු සමිති අත්පොත 12හි 3.6 ඡේදය ප්‍රකාරව, සමෘද්ධි කළමනාකරු සහ සම්බන්ධිත පාර්ශවයන් ගෙන් මුදල් ලැබීම් පොත් නැතිවීම සම්බන්ධයෙන් එක් පොතක් සඳහා රු.25,000ක් බැගින් සම්පූර්ණයෙන් රු.5,000,000ක් අයකළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බලය පවරා නොමැත. මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙම කරුණට විගණන පිළිතුරු දීම සුදුසු නොවන බව. | මෙම විෂයට අදාල බලයලත් නිලධාරියා වෙත වාර්තා කර විධිමත් පරීක්ෂණයක් පවත්වා නීති රීති ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩලයට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක තනතුරු වර්ග 04ක පුරප්පාඩු 28ක් සහ අතිරික්ත 118ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවතුණි. | රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් සෘජුව දිවයින පුරා සිදුකළ සංවර්ධන නිලධාරී පත්වීම්වලදී තනතුරු පුරප්පාඩු සැලැකිල්ලට නොගන්නා ලදී. | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදුකර අවශයතාවය අනුව පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම හෝ වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වර්ෂ 05කට අධික කාලයක් ස්ථාන මාරුවීම් නොලබා නිලධාරීන් 315ක්, එකම සේවා ස්ථානයක අඛණ්ඩව රාජකාරි ඉටුකරමින් පැවති බව නිරීක්ෂණය විය. | සේවා කාලය සැලැකිල්ලට ගෙන ස්ථාන මාරුකිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව, ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය. |